# 2022 කාන්තා දින සැමරුම

“රටකි දැයකි ලොවකි ඇය” තේමාව කරගත් 2022/03/08 දිනට යෙදුන ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව කම්කරු දෙපාර්තමේන්තුවේ කාන්තා දින සැමරීම කටුනායක අපනයන සැලසුම් කලාපයේ සේවිකාවන් 100 ක් සඳහා කම්කරු අමාත්‍ය ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2022.03.09 දින කටුනායක ආයෝජන මණ්ඩලයේ ශ්‍රවනාගාරයේදී පවත්වන ලදී.

මෙහිදී,

- කටුනායක අපනයන සැලසුම් කලාපයේ සේවිකාවන් සඳහා “මන සුව සලසන මියුරු ගී මියැසිය” විචාරාත්මක සංගීත වැඩ සටහනක් ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සංගීත කණ්ඩායම හා ගායක ගායිකාවන්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී.

- පෞද්ගලික හා අර්ධ රාජ්‍ය අංශයේ රැකියාලාභී හා රැකියා අපේක්ෂිත පුද්ගලයන්ගේ රැකියා ජීවිතයට පිටුවහලක් වනු පිණිස උපදෙස් මාලාවක් අන්තර්ගත අත්පොත (රැකියා වාර්තාව) නැවත මුද්‍රණය කර බෙදා දීම හා කාන්තා සේවා නියුක්තිය තේමා කරගත් “කතිකාව සහරාව” මුද්‍රණය කර බෙදා දීම ප්‍රධාන වශයෙන් සිදුකරන ලදී.

- එසේම ලංකාවම ආවරණය වන පරිදි කාන්තා දිනයට සමගාමීව කලාප කම්කරු කාර්යාල 11 විසින් සේවා යෝජකයින් 50 දෙනෙකු බැගින් සහභාගි කරවා ගනිමින් කාන්තාවන්ට බලපාන කම්කරු නීති පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් 22 ක් පැවැත්වීම ද කාන්තා හා ළමා කටයුතු අංශය සේවිකාවන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් 05ක් පැවැත්වීමට කටයුතු කර ඇත.

